[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2005 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2005 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2005

ආර්ථික විද්‍යාව II (I කොටස)
பொருளியல் II (பகுதி I)
Economics II (Part I)

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

විභාග අංකය ..............................

සැලකිය යුතුයි :

- මෙම කොටසේ ප්‍රශ්න **20** ක් ඇත. ඒ සියලු ම ප්‍රශ්න අනිවාර්ය වේ.
- එක් ප්‍රශ්නයකට **ලකුණු 02** ක් ලැබෙන අතර, මුළු කොටසට ලකුණු **40** ක් හිමි වේ.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතුයි.
- එක් බහුවරණ ප්‍රශ්නයකට ඇත්තේ **එක් නිවැරදි පිළිතුරක්** පමණි. එම පිළිතුර හඳුනාගෙන පිළිතුරට යටින් ඉරක් අඳින්න.
- නියමිත කාලය අවසන් වූ විට **I** හා **II** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා භාර දිය යුතුයි.

---

**1.** $M_2$ මුදල් සැපයුමට ඇතුළත් වන්නේ,

(i) දෛනික ගනුදෙනු සඳහා යොදාගත නොහැකි ද්‍රවශීලතාවෙන් වැඩි සියලු ම වත්කම්වල එකතුවකි.
(ii) $M_1$ සහ පහසුවෙන් පටු මුදල් බවට පරිවර්තනය කරගත හැකි ඉතුරුම්, අනේවාසික විදේශ මුදල් තැන්පතු වැනි සමීප ආදේශන වත්කම්වල එකතුවකි.
(iii) $M_1$ සහ පටු මුදල් බවට පරිවර්තනය කර ගත හැකි සියලු ම වත්කම්වල එකතුවකි.
(iv) $M_1$, තැන්පත් සහතික, ණයපත් ශේෂ සහ බැරපත් ශේෂ යන මේවායේ එකතුවකි.
(v) $M_1$ සහ මහජනයා විසින් වාණිජ බැංකුවල තබාගන්නා ඉතුරුම් හා කාලීන තැන්පතුවල එකතුවකි.

**2.** වාණිජ බැංකුවක පහත සඳහන් වත්කම් අතුරෙන් අඩුම ද්‍රවශීලතාවක් ඇති වත්කම කුමක් ද?

(i) භාණ්ඩාගාර බිල්පත්
(ii) මහ බැංකුවේ ඇති ශේෂ
(iii) කැට මුදල්
(iv) ගනුදෙනුකරුවන්ට දෙන ලද අත්තිකාරම්
(v) ඒක්ෂණ මුදල්

**3.** මහ බැංකුවට මුදල් සැපයුම අඩු කළ හැක්කේ,

(i) මහජනතාවට පිළිණපත් විකිණීමෙනි.
(ii) සංචිත අවශ්‍යතා පහළ හෙළීමෙනි.
(iii) වට්ටම් අනුපාතිකය පහළ හෙළීමෙනි.
(iv) විදේශ විනිමය මිල දී ගැනීමෙනි.
(v) විවට වෙළෙඳපොළේ සුරැකුම්පත් මිලට ගැනීමෙනි.

**4.** තෝරාගත් ආර්ථික විචල්‍ය කිහිපයක අගයයන් දර්ශක ඇසුරෙන් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | මිල මට්ටම | මුදල් සැපයුම | සංසරණ ප්‍රවේගය | අවසන් ගනුදෙනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | 100 | 100 | 100 | 100 |
| 2 | - ? - | 120 | 100 | 80 |

දෙවැනි (2) වර්ෂයේ දී මිල මට්ටම දක්වෙන දර්ශකය කුමක් ද?

(i) 100 (ii) 120 (iii) 150 (iv) 180 (v) 200

[ දෙවැනි පිටුව බලන්න.

www.pastpaperlk.com
www.artsapi.lk

**5.** නාමික ජාතික ආදායම හා මිල මට්ටම යන දෙක ම දෙගුණ වුවහොත්,

(i) නාමික ආදායම ඉහළ යනු ඇත.
(ii) මූර්ත ආදායම ඉහළ යනු ඇත.
(iii) උද්ධමනයක් පවතී.
(iv) සාපේක්ෂ මිල ඉහළ යනු ඇත.
(v) ඉහත (i) හා (iii) සිදුවිය හැකි ය.

**6.** සාපේක්ෂ වාසි න්‍යායට අනුව ජාත්‍යන්තර වෙළෙඳාමෙන් වාසි ලැබිය හැක්කේ, රටවල් අතර

(i) ශ්‍රම පිරිවැය වෙනස් වේ නම් ය.
(ii) ආවස්ථික පිරිවැය අනුපාත වෙනස් වේ නම් ය.
(iii) ඵලදායිතාව වෙනස් වේ නම් ය.
(iv) මිල ගණන් වෙනස් වේ නම් ය.
(v) ප්‍රවාහන පිරිවැය වෙනස් වේ නම් ය.

**7.** වර්ෂ දෙකක කාලයක් තුළ කිසියම් රටක ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ දර්ශක කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | විනිමය අනුපාතය | අපනයන පරිමා දර්ශකය | ආනයන පරිමා දර්ශකය | වෙළෙඳ ශේෂය (SDR) |
|---|---|---|---|---|
| 1 | 100 | 100 | 100 | 0 |
| 2 | 100 | 90 | 100 | මිලියන + 300 |

ඉහත දක්වන ලද තොරතුරු සමග එකඟ වන්නේ පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?

(i) අපනයන මිලෙහි පහළ වැටීමක් සිදුවී ඇත.
(ii) වෙළෙඳ අනුපාතයෙහි වාසි සහගත තත්ත්වයක් හටගෙන ඇත.
(iii) ආනයන මිල ගණන් වැඩිවී ඇත.
(iv) මූර්ත ඒකපුද්ගල ආදායම් මට්ටමෙහි වෙනසක් සිදුවී නොමැත.
(v) විනිමය අනුපාතය ක්ෂයවී ඇත.

**8.** වෙළෙඳ අනුපාතයෙහි අවාසිදායක තත්ත්වයකින් අදහස් වන්නේ,

(i) අපනයන පරිමාවේ අඩු වීමකි.
(ii) අපනයන මිල ගණන් වැඩි වීමකි.
(iii) අපනයන ඉපැයුම්වල වටිනාකම අඩු වීමකි.
(iv) ආනයන මිල ගණන්වලට සාපේක්ෂව අපනයන මිල ගණන්වල අඩු වීමකි.
(v) ආනයන පරිමාවට සාපේක්ෂව අපනයන පරිමාවේ අඩු වීමකි.

**9.** පහත සඳහන් දෑ අතුරෙන් ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමෙහි අතුළත් කළ හැක්කේ කුමක් ද?

(i) විදේශ ආයෝජකයන්ට ගෙවන ලද ලාභාංශ
(ii) ජර්මන් ජාතික සංචාරකයන් ශ්‍රී ලංකාවේ දී කරනු ලබන වියදම්
(iii) ශ්‍රී ලාංකික සංචාරකයන් ජපානයේ දී කරනු ලබන වියදම්
(iv) ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සංස්ථාවේ වත්කම් මිල දී ගත් ඉන්දියානු ආයෝජකයන්ගෙන් ලබන පෞද්ගලීකරණ ලැබීම්
(v) ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගන්නා ලද ණය සඳහා පොලී ගෙවීම

**10.** ශ්‍රී ලංකාවේ රුපියලෙහි විදේශ අගය ක්ෂයවීමට බොහෝ දුරට අවකාශ තිබෙන්නේ,

(i) ශ්‍රී ලංකා රජය විදේශ රටවලින් අධික ලෙස ණය ගැනීමෙනි.
(ii) සුනාමි ව්‍යසනයෙන් ආපදාවට ලක්වූවන්ට ආධාර කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට විදේශ ප්‍රදාන අධික ලෙස ලැබීමෙනි.
(iii) ශ්‍රී ලංකාවට ආනයන කරන භාණ්ඩ සඳහා අය කෙරෙන තීරු බදු ඉහළ නැංවීමෙනි.
(iv) ශ්‍රී ලංකාව ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය නැවත හඳුන්වාදීමෙනි.
(v) අනෙක් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය ඉහළ යාමෙනි.

www.pastpaperlk.com
www.artsapi.lk

11. සාමාන්‍යයෙන් ආර්ථික වෘද්ධිය නිර්වචනය කරනුයේ,
   (i) නිමැවුමේ වර්ධන වේගයෙන් ශ්‍රම හමුදාවේ වර්ධන වේගය අඩු කිරීමක් වශයෙනි.
   (ii) කාලපරිච්ඡේදයක් තුළ මූර්ත නිමැවුමේ අඛණ්ඩ වර්ධනයක් වශයෙනි.
   (iii) යෙදවුම් සැපයුමේ වැඩි වීමක් වශයෙනි.
   (iv) අත්‍යවශ්‍ය භාණ්ඩවල මූර්ත පිරිවැය අඩු වීමක් වශයෙනි.
   (v) නාමික ජාතික ආදායමේ වැඩි වීමක් වශයෙනි.

12. මෑත වර්ෂවල (2001 - 2003) ශ්‍රී ලංකාවේ දේශීය ඉතුරුම් අනුපාතය
   (i) 12% – 14% කි.
   (ii) 14% – 16% කි.
   (iii) 16% – 18% කි.
   (iv) 18% – 20% කි.
   (v) 20% – 22% කි.

13. නාමික දළ දේශීය නිෂ්පාදිතය 6% කින් ද, සාමාන්‍ය මිල මට්ටම 4% කින් ද, ජනගහනය 2% කින් ද වැඩි වූයේ නම් මූර්ත ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය වෙනස් වූයේ,
   (i) – 2% කිනි.
   (ii) 0% කිනි.
   (iii) 2% කිනි.
   (iv) 6% කිනි.
   (v) ඉහත සඳහන් කිසිම වර්ධන වේගයකින් නොවේ.

14. ශ්‍රම ඵලදායිතාවේ වර්ධනයකින් අපේක්ෂා කළ නොහැකි ප්‍රතිලාභයක් වනුයේ,
   (i) ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාමයි.
   (ii) රට තුළට සෘජු විදේශ ආයෝජන ඇද ගැනීමයි.
   (iii) අපනයන ඉපයුම් වැඩි වීමයි.
   (iv) ආර්ථික වර්ධන වේගය ඉහළ යාමයි.
   (v) ආදායම් ව්‍යාප්තියේ විෂමතා ඉවත්කර ගැනීමයි.

15. සේවා වියුක්ත ජනගහනයෙන් කොටසක් සක්‍රීය ලෙස රැකියා අපේක්ෂා කිරීම අත්හැර දමනු ලැබුවහොත් පහත සඳහන් දෑ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රතිඵලය දක්වෙන සංයෝගය කුමක් ද?

| | ශ්‍රම බලකායේ ප්‍රමාණය | ශ්‍රම සහභාගිත්ව අනුපාතිකය | සේවාවියුක්ත අනුපාතිකය |
|---|---|---|---|
| (i) | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |
| (ii) | අඩු වේ | අඩු වේ | අඩු වේ |
| (iii) | අඩු වේ | වැඩි වේ | අඩු වේ |
| (iv) | වැඩි වේ | අඩු වේ | වැඩි වේ |
| (v) | අඩු වේ | අඩු වේ | වැඩි වේ |

16. පහත සඳහන් කණ්ඩායම් අතුරෙන් ඌන සේවා නියුක්ති ජනගහනයට ඇතුළත් වනුයේ,
   (i) වැඩ කිරීමට කැමති එහෙත් රැකියාවක් සොයාගැනීමට අපොහොසත් පුද්ගලයින්
   (ii) රැකියාවන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් කරන සේවා නියුක්ත පුද්ගලයින්
   (iii) තමා කරමින් සිටි රැකියාවෙන් අස්වී, ඊට වඩා හොඳ රැකියාවක් අපේක්ෂාවෙන් සිටින පුද්ගලයින්
   (iv) ස්වේච්ඡාවෙන් අඩු වැටුපකට රැකියාවක් කරන පුද්ගලයින්
   (v) වෙහෙස මහන්සිවී පූර්ණකාලීනව වැඩකරන නමුත් අඩු ආන්තික ඵලදායිතාවක් සහිත පුද්ගලයින්

17. පහත සඳහන් දෑ අතුරෙන් සහස්‍ර සංවර්ධන අභිමතාර්ථයක් නොවනුයේ කුමක් ද?
   (i) අන්ත දුගීභාවය හා කුසගින්න පිටුදැකීම
   (ii) පරිසරයේ තිරසාර පැවැත්ම සහතික කිරීම
   (iii) මාතෘ සෞඛ්‍යය නංවාලීම
   (iv) උපත් අනුපාතිකය අඩු කිරීම
   (v) සංවර්ධනය සඳහා ජගත් හවුල්කාරීත්වයක් ගොඩනැගීම

[ හතරවැනි පිටුව බලන්න.

www.pastpaperlk.com www.artsapi.lk

www.pastpaperlk.com

18. රටක සාමාන්‍ය ජීවන තත්ත්වය පහත වැටීම සඳහා බලපානුයේ පහත සඳහන් කරුණු අතුරෙන් කවරක් ද?
   (i) ජනගහනය හා දළ ජාතික නිෂ්පාදිතය සමාන ප්‍රතිශතයකින් වැඩි වීම
   (ii) ජනගහනය වැඩිවනවාට වඩා අඩු වේගයකින් දළ ජාතික නිෂ්පාදිතය වැඩි වීම
   (iii) ජනගහනයේ වෙනසක් නොමැතිව දළ ජාතික නිෂ්පාදිතය වැඩි වීම
   (iv) දළ ජාතික නිෂ්පාදිතය වෙනස් නොවී ජනගහනය අඩු වීම
   (v) ජනගහනය අඩුවනවාට වඩා අඩු වේගයකින් දළ ජාතික නිෂ්පාදිතය අඩු වීම

19. මානව සංවර්ධන දර්ශකය යනු මූලික මිනිස් අවශ්‍යතා පිළිබඳ දර්ශකයන්හි එකතුවකි. පහත සඳහන් දෑ අතුරෙන් මානව සංවර්ධන දර්ශකයට ඇතුළත් **නොවන්නේ** කුමක් ද?
   (i) උපතේ දී ජීවන අපේක්ෂාව
   (ii) පාසල්වලට ඇතුළත්වීමේ දළ අනුපාතය
   (iii) ක්‍රය ශක්ති සාම්‍යයට අනුව ගණනය කරන ලද ඒකශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය
   (iv) ළදරු මර්ත්‍යතාව
   (v) වැඩිහිටි සාක්ෂරතාව

20. ගිනි සංගුණකයෙන් මැනිය හැකි වන්නේ,
   (i) නිරපේක්ෂ දරිද්‍රතා මට්ටමයි.
   (ii) සාපේක්ෂ ආදායම් විෂමතා මට්ටමයි.
   (iii) සැඟවුණු සේවා වියුක්තියයි.
   (iv) දරිද්‍රතා ඉමයි.
   (v) ආර්ථික වෘද්ධි වේගයයි.

* *

www.artsapi.lk
www.pastpaperlk.com

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

92533

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2005 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2005 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2005

ආර්ථික විද්‍යාව II (II කොටස)
பொருளியல் II (பகுதி II)
Economics II (Part II)

පැ දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

※ "අ" උප කොටසින් ප්‍රශ්න දෙකක් ද,
"ආ" උප කොටසින් ප්‍රශ්න දෙකක් ද, තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

---

## "අ" උප කොටස
(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

**1.** (අ) තරගකාරී බැංකු පද්ධතියක් තුළ කටයුතු කරන වාණිජ බැංකුවලට අධි සංචිත පවතී නම් ඒවා මුළුමනින් ම ණය දීම සඳහා යොද ගත හැකි බවත්, වාණිජ බැංකු ක්‍රියාත්මක වන්නේ 25% ක ව්‍යවස්ථාපිත සංචිත මත බවත්, එම බැංකු තුළ රුපියල් මිලියන 2000 ක් වටිනා මහජනතාවගේ තැන්පතු පවතින බවත්, මුළු මුදල් සැපයුම ($M_1$) රුපියල් මිලියන 2500 ක් බවත් උපකල්පනය කරන්න.

(i) බැංකු විසින් ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02 යි)

(ii) මහජනතාව තමන් සතු රුපියල් මිලියන 100 ක කාසි හා නෝට්ටු බැංකුවල තැන්පත් කරන බව සිතන්න. වාණිජ බැංකු, ණය දීම මඟින් අවශ්‍ය ගැළපුම් කරන්නේ නම් බැංකු ක්‍රමයේ මුළු තැන්පතු ප්‍රමාණය කොපමණ වේ ද? (ලකුණු 04 යි)

(iii) සියලු ගැළපුම් කිරීමෙන් පසු $M_1$ මුදල් සැපයුම කොපමණ ද? (ලකුණු 04 යි)

(ආ) වාණිජ බැංකු විසින් සැබෑ වශයෙන් මවනු ලබන ණය ප්‍රමාණය, තැන්පතු ගුණකයෙන් මැවීමට නිර්දේශිත ණය ප්‍රමාණයට වඩා අඩු වීමට බලපාන හේතු සඳහන් කරන්න. (ලකුණු 05 යි)

**2.** (අ) මහ බැංකුවේ විවට වෙළෙඳ කටයුතු බැංකු පද්ධතියේ සංචිත මට්ටම කෙරෙහි බලපාන්නේ කෙසේ ද? (ලකුණු 05 යි)

(ආ) මුදල් වෙළෙඳපොළ කෙරෙහි විවට වෙළෙඳ කටයුතුවල බලපෑම කුමක් ද? (ලකුණු 05 යි)

(ඉ) මුදල් වෙළෙඳපොළෙහි වෙනස්වීම් සමාහාර ඉල්ලුම කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**3.** (අ) නිරපේක්ෂ වාසි හා සාපේක්ෂ වාසි අතර වෙනස කවරේද? (ලකුණු 05 යි)

(ආ) සාපේක්ෂ වාසි හටගැනීමට ඉවහල් වන හේතු කවරේද? (ලකුණු 05 යි)

(ඉ) ආරක්ෂණවාදයට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක කවරේද? (ලකුණු 05 යි)

**4.** (අ) "පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 05 යි)

(ආ) ව්‍යවහාර මුදලක බාහිර වටිනාකම ක්ෂයවීම හා අවප්‍රමාණ කිරීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(ඉ) රටක විනිමය අනුපාතය ක්ෂයවීම අවශ්‍යයෙන් ම වෙළෙඳ ශේෂයේ වර්ධනයක් ඇති කරන්නේ ද? (ලකුණු 05 යි)

www.pastpaperlk.com
www.artsapi.lk

www.pastpaperlk.com

"ආ" උප කොටස
(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

5. (අ) ආර්ථිකයක ප්‍රධාන සාර්ව ආර්ථික අරමුණු කවරේද? (ලකුණු 0

(ආ) මෙම අරමුණු එකිනෙක සමග ගැටෙන්නේ මන්නිසාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 0

(ඉ) සාර්ව ආර්ථික අරමුණු මුදුන්පත් කර ගැනීමට රජයකට අනුගමනය කළ හැකි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කවෙ (ලකුණු 0

6. (අ) 1990 - 2002 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතා මට්ටමේ උපනති විමසන්න. (ලකුණු 0

(ආ) ශ්‍රී ලංකාවේ නාගරික අංශය සමග සසඳනවිට ග්‍රාමීය අංශයේ දරිද්‍රතාවය ඉහළ මට්ටමක පැවතීමට හේතු මොනවා ද? (ලකුණු 0

(ඉ) මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩු කිරීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද? (ලකුණු 0

7. "මූල් බැසගත් ව්‍යුහාත්මක දුර්වලතාවන් නිසා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ වර්ධන වේගය ඉතා පහත් මට් පවතී."

(අ) 2001 - 2003 කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයෙන් කරන ලද දයකත්වය නිෂ්පාදන සේවා අංශයන්හි දයකත්වය සමග සසඳන්න. (ලකුණු 0

(ආ) කෘෂිකාර්මික නිමැවුමේ වර්ධනය අඩාල කරන මූල් බැසගත් ව්‍යුහාත්මක දුර්වලතාවයන් මොනවා ද? (ලකුණු 0

(ඉ) කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා ඉදිරිපත් කරන ලද ජාතික කෘෂිකාර්මික හා පශු සම්පත් ප්‍රතිපත් වැදගත් උපාය මාර්ග සඳහන් කරන්න. (ලකුණු 0

8. (අ) නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය පහත් මට්ටමක පැවතීමට බලපාන ලද ප්‍රධාන ස කවරේද? (ලකුණු 0

(ආ) ශ්‍රී ලංකාව සඳහා වඩා වේගවත් සහ සාධාරණ ආර්ථික වෘද්ධියක් ලබා කරගැනීමට ඔබ ඉදිරිපත් ක නිර්දේශ කවරේද? (ලකුණු 0

* * *

www.pastpaperlk.com
www.artsapi.lk
www.pastpaperlk.com
www.pastpaperlk.com
www.pastpaperlk.com